**ජාතික යොවුන් සේනාංකය - 2023**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික යොවුන් සේනාංකයේ ("සේනාංකය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික යොවුන් සේනාංකය මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සේනාංකය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සේනාංකය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සේනාංකයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සේනාංකයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සේනාංකයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සේනාංකයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සේනාංකයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සේනාංකයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සේනාංකයේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පෙර වර්ෂවල වාහන අළුත්වැඩියාව සඳහා දරණ ලද රු1,415,475 ක පුනරාවර්තන වියදම් සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වත්කම් රු. 1,195,180 ක්ද ක්ෂය රු.283,095 ක්ද වැඩියෙන් ද දක්වා තිබුණි. | පෙර වර්ෂවල වාහන අළුත්වැඩියාව සඳහා දරණ ලද රු1,493,975 ක වියදම තුල ඇතුලත්ව ඇති ප්‍රාග්ධන වියදම රුපියල් 894,450.00 ක් ලෙසත් පුනරාවර්තන වියදම රුපියල් 599,550.00 ක් ලෙසත් වෙන් කර දැක්විය හැක. ඒ අනුව පුනරාවර්තන වියදම වූ රුපියල් 599,550.00 අදාල ව ක්ෂය, වත්කම් සහ ප්‍රත්‍යාගණන සංචිත වලට අදාල ගැලපුම් 2024 වර්ෂයේ දී සිදු කිරීමට කටයුතු කරමි. | වියදම් ගිණුම්ගත කිරීමේ දී නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) 2023 වර්ෂයේදී සේවයෙන් ඉවත් වූ නිලධාරීන් 29 දෙනෙකුට පාරිතෝෂික ලෙස ගෙවා තිබූ රු.3,056,550 ක් පාරිතෝෂික ප්‍රතිපාදන ගිණුමෙන් අඩු නොකිරීම හා එක් නිලධාරියෙකුට ගෙවිය යුතු පාරිතෝෂිකය රු.104,500 කින් අධි ගණනය කිරීම හේතුවෙන් ගෙවිය යුතු පාරිතෝෂිකය හා වර්ෂයේ ඌණතාවය රු. 3,161,050 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිසි පරිදි ශේෂ සැසඳීම් තුළින් මෙවැනි අතපසුවීම් අවම කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | පාරිතෝෂික ගණනය කිරීම හා ගිණුම්ගත කිරීම නිවැරදිව සිදුකල යුතුය. |
| (ඇ) සේනාංකය විසින් භාවිතා කරනු ලබන මෝටර් රථ 03ක වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | වාහන 03ක ලියාපදිංචි සහතිකවල පිටපත්හි තොරතුරු අපැහැදලි තත්වයේ තිබුණි. ඒ අනුව පැහැදිලිව තොරතුරු බලාගැනීමට හැකි පිටපත් සපයාගෙන තක්සේරු කිරීම් සිදු කිරීම සඳහා වේරහැර ප්‍රධාන කාර්යාලයෙන් පරීක්ෂකවරයෙකු පත් කර ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | ස්ථාවර වත්කම්වල අයිතිය පවරා ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් කොන්ත්‍රාත් වෙනුවෙන් ලබා දී තිබුණු රු.108,558,448 ක අත්තිකාරම් ශේෂය තුල අවුරුදු 5 කට වඩා හා අවුරුදු 2-3 අතර කාලයක සිට පැවත එන පිළිවෙලින් රු.101,968,773 ක හා රු.6,639,675 ක ශේෂයන් අයකර ගැනීම සඳහා විධිමත් හා ඵලදායී පියවර ගෙන නොතිබුණි. තවද, 2023 දෙසැම්බර් 31 දිනට පැවති වසර 05කට වඩා පැරණි රු.50,000 ක කුළී අත්තිකාරම් ශේෂයද පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දී ඇති අවුරුදු 5 ට වඩා පැරණි අත්තිකාරම් ලෙස රු 101,968,773 ක මුදලක් දක්වා ඇති අතර එම ශේෂයෙන් රු.50,000 ක අත්තිකාරම් මුදලක් දක්වා ඇත්තේ, රත්මලාන ප්‍රදේශයේ තාවකාලිකව පවත්වාගෙන යනු ලැබූ ගබඩා ගොඩනැගිල්ලෙහි කුලි වෙනුවෙනි. | ලැබිය යුතු මුදල් අප්‍රමාදව නිරවුල් කල යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.24,427,474 ක ගෙවිය යුතු ශේෂ තුල වසර 05 කට වඩා පැරණි හා වසර 2-3 ක් අතර කාලයක සිට පැවත එන පිළිවෙලින් රු.2,180,986 ක හා රු.9,297,851 ක වූ ශේෂ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම කෙරෙහි හැර අදාල ශේෂයන් පියවීම සම්බන්ධයෙන් සොයාබලා ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේ අන්‍යෝන්‍ය අවබෝධතා මත ගිවිසුම අවලංගු කර කොන්ත්‍රාත්කරු වෙත රැඳවුම් මුදල් නිදහස් කිරීමට හා රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු මුදල් අප්‍රමාදව නිරවුල් කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2 (ඒ) ඡේදය | අවම වශයෙන් වර්ෂයකට මාස තුනකට වරක් හෝ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත් විය යුතු වුවත් සේනාංකය විසින් 2023 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් පමණක් පවත්වා තිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුව සඳහා අවශ්‍ය සාමාජිකයන් පත් කිරීම මේ වන විට සම්පූර්ණව ඇති අතර ඉදිරි කාල සීමාව තුල නව විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් සමඟින් නියමිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට හැකි බව පෙන්වා දෙමි. | චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ)2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරණ චක්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 ඡේදය | ආයතනය විසින් භාවිතා කරන සෑම වාහනයක්ම ආයතනය නමින්ම ලියාපදිංචි කර තිබීමේ අවශ්‍යතාවය අවධාරණය කර තිබුණද සේනාංකය සතු වාහන 07 ක් එසේ ලියාපදිංචි කර නොතිබුණි. | ලියාපදිංචි අයිතිය පවරාගැනීමට අදාල MT6 පෝරමය යොමු කිරීම හා අමාත්‍යාංශය වෙත යොමු කර මේ සම්බන්ධව නැවත විමසීම් කර ඇත. | සේනාංකය සතු වාහන ආයතනය නමින් ලියාපදිංචි කිරීමට කටයුතු කල යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචන**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු 58,937,916 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 5,093,224 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 53,844,692 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මුළු ආදායමේ වැඩිවීමට වඩා මෙහෙයුම් වියදම හා තරුණ සංවර්ධන කාර්යන් හි වියදම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට සේනාංකයේ පුහුණු මධ්‍යස්ථාන ස්ථාපිත කර තිබූ ඉඩම් 63 ක් අතරින් ඉඩම් 28 ක් පමණක් සේනාංකයට පවරාගෙන තිබුණු අතර ඉතිරි ඉඩම් 35 ක් පවරා ගැනීමේ කටයුතු මෙතෙක් නිම කර නොතිබුණි. | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන පිහිටි ඉඩම් 63 අතරින් ඉඩම් 28 ක පවරා ගැනීම් අවසන් කර ඇති අතර තවත් ඉඩම් 05 ක් පවරාදීම ප්‍රාදේශීය ලේකම්වරුන් හා පළාත් ඉඩම් කොමසාරිස්වරුන් විසින් නිර්දේශ කර ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කර ඇත. ඉතිරි ඉඩම් 30 හි පවරා ගැනීම් කටයුතුද සිදු කරමින් පවතී. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු අප්‍රමාදව සිදු කල යුතුය. |

**3.2** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේනාංකයේ ප්‍රධාන කාර්යයන් වූ යොවුන් සංවර්ධනය, රැකියා පුහුණුව සහ වෘත්තීමය අධ්‍යාපනය කාර්යක්ෂමව හා ඵලදායීව කරගෙන යාම සඳහා අවශ්‍ය මධ්‍යස්ථානාධිපති සහ උපදේශක තනතුරු 137ක් දිගින් දිගටම පුරප්පාඩු වී පැවතීම සේනාංකයේ අරමුණු කරා ළඟා වීම හා පාඨමාලාවල ගුණාත්මක භාවය ආරක්ෂා කර ගැනීම කෙරෙහි | පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට දිගින් දිගටම කරන ලද ඉල්ලීමට අනුව අමප/23/0822/605/012–III හා 2023 මැයි 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ කාර්යයන් සඳහා අග්‍රාමාත්‍ය ලේකම්ගේ සහභාගීත්වයෙන් පත්කර ඇති කමිටුවේ නිර්දේශය මත ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයන් සඳහා මධ්‍යස්ථානාධිපති තනතුරු 18, සරඹ උපදේශක තනතුරු 48, තොරතුරු තාක්ෂණ උපදේශක තනතුරු 14 හා | අත්‍යවශ්‍ය පුරප්පාඩු සඳහා අප්‍රමාදව බඳවා ගැනීම් සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| දැඩිව බලපා තිබුණි. | ඉංග්‍රීසි භාෂා උපදේශක තනතුරු 20 සඳහා පමණක් බඳවා ගැනීමට අනුමැති ලැබිණි. ඒ අනුව උක්ත තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | |

### 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රීඩාවෙන් ජාත්‍යන්තරය ජයගනිමු වැඩසටහන යටතේ අත්පන්දු, දැල්පන්දු, දුනු විදීම හා ඉලක්කයට වෙඩි තැබීම යන ක්‍රීඩාවන් සඳහා තරුණ තරුණියන් පුහුණු කිරීම හා දිරිගැන්වීම මඟින් ඒ ඒ ක්‍රීඩාවන් සඳහා දක්ෂතා අනුව හඳුනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 750 ක සංචිතයක් තෝරාගෙන තිබුණි. එම සංචිතයෙන් 2024 ඔලිම්පික් ක්‍රීඩා උළෙල නියෝජනය හා ජයග්‍රහන ලබා ගැනීම සහ 2025 වර්ෂයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 150 ක් රැකියාගත කිරීමේ අපේක්ෂාවෙන් 2022 වර්ෂයේදී සේනාංකය වෙත ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් රු. මිලියන 17.5 ක් ලබා දී තිබුණි. නමුත් 2023 වර්ෂය අවසන් වන විටත් අපේක්ෂිත කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි. තවද ඒ සඳහා ලබාදුන් මුදලින් රු. මිලියන 7.5 ක් වෙනත් කාර්යයන් සඳහා යොදවාගෙන තිබුණු අතර රු. මිලියන 10 ක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි. | මේ වන විට වොලිබෝල්, නෙට්බෝල්, දුනු විදීම හා වායු රයිෆල් යන ක්‍රීඩා අංශයන්ගෙන් පළාත් මට්ටමින් හඳුනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගෙන් සමන්විත ක්‍රීඩා කණ්ඩායම් පුහුණු කටයුතු සිදු කරමින් පවතී.<br><br>ක්‍රීඩා සංවර්ධන අරමුදල සඳහා වූ රු 17.5 ක ප්‍රදාන මුදලින් ඉතිරි මුදලින් රු මිලියන 10 ක මුදලක් 2023 වර්ෂයේ අප්‍රේල් මස ස්ථාවර තැනපතුවක ආයෝජනය කලද, වර්ෂය අවසානයේදී මෙම අරමුදලින් ඉතිරිව ඇති ශේෂය වන්නේ රු මිලියන 4.7 ක ප්‍රමාණයක් බවත් පෙන්වා දෙමි. | ප්‍රතිපාදන අදාළ කාර්යය වෙනුවෙන් යෙදවිය යුතුය. |

### 3.4 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සෑම දිනකම අවසානයේදී සේනාංකයේ බැංකු ජංගම ගිණුමක අවම වශයෙන් රු. 13,935,401ක සිට රු.156,106,568 ක් දක්වා වූ පරාසය තුළ මුදල් ශේෂයක් ලාභදායි ලෙස අයෝජනය නොකර අක්‍රියව තබා තිබුණි. | ජාතික යොවුන් සේනාංකයේ ජංගම ගිණුමෙහි බැංකු ශේෂය ඉහළ අගයක පැවතුණද මුදල් පොත අනුව ශේෂය ඊට සාපේක්ෂව අඩු අගයක පැවති බව පෙන්වා දීමට කැමැත්තෙමි.<br>ජාතික යොවුන් සේනාංකය සඳහා එක් බැංකු ගිණුමක් පවත්වාගෙන යනු ලබන අතර මධ්‍යස්ථාන 58 අදාළ සියලු වියදම් ගෙවීම් එම බැංකු ගිණුම තුළින් සිදුවන අතර ලංකාව පුරා පවතින එම මධ්‍යස්ථාන ජාලයට අදාළ බිල්පත් දෛනිකව ගෙවීම් කටයුතු සඳහා මුලස්ථානයට ඉදිරිපත් වේ. ඒ අනුව දෛනිකව බිල්පත් නිරවුල් | බැංකු ශේෂය විධිමත් කළමනාකරණයකින් පවත්වා ගත යුතුය. |

කිරීම සඳහා සැළකිය යුතු මුදල් ශේෂයක් පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය කරුණකි.

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රවර්තන වර්ෂය තුල ක්‍රීඩා උපකරණ භාවිතයේ අවශ්‍යතාව නොතිබුණද රු.1,123,850 ක ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම් සිදුකර තිබුණි. වර්ෂය තුල මෙම ක්‍රීඩා උපකරණ භාවිතා කර නොතිබූ අතර වර්ෂ අවසානයට අතැති තොගය රු.1,796,399 ක්ව පැවතුණි. තවද, මෙම මිලදී ගැනීම් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට සහ ප්‍රසම්පාදන සැලැස්මටද ඇතුලත් කර නොතිබුණි. | ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට ඇතුලත් කර නොතිබූ අතර, එය ක්‍රීඩා සංවර්ධන අරමුදලට අදාල ක්‍රියාකාරී සැලැස්ම තුල අන්තර්ගත කර මිලදී ගැනීම් සිදු කර ඇත. | අතිරික්ත තොග රඳවා ගැනීමකින් තොරව මිලදී ගැනීම් සිදු කළ යුතුය. |
| (ආ) සේනාංකය විසින් රු.5,514,999 ක වියදමක් දරා ඉදිකල වායු රයිෆල් පුහුණු පරාසය 2023 ජූලි 06 දින විවෘත කිරීමෙන් පසුව විගණිත දින වන 2023 සැප්තැම්බර් 26 තෙක් දින දෙකක් පමණක් භාවිතා කර තිබුණි . යොවුන් සේනාංක පුහුණු ලාභීන් විසින් මෙම වායු රයිෆල් පුහුණු පරාසය භාවිතා කර නොතිබුණු අතර භාවිතයට ගෙන තිබුනේද පාසල් දෙකක් විසිනි. ඒ අනුව මෙමගින් බලාපොරොත්තු වූ ඉලක්ක සපුරා ගැනීමට සහ අපේක්ෂිත කාර්යසාධන මට්ටම ළඟා කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | දිවුලපිටිය පුහුණු මධ්‍යස්ථානයේ ස්ථාපිත කල ක්‍රීඩා පුහුණු පාසැල ක්‍රියාකාරී ලෙස පවත්වාගෙන යෑමට ඒ සඳහා ප්‍රවීන නිළධාරියෙකු පත් කර ගැනීමක් මේ වන විට සිදු කර ඇති අතර, එහි පුහුණු කටයුතු 2024 වර්ෂයේ ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව යොවුන් සේනාංකයේ සහ බස්නාහිර පළාතට අයත් පාසැල් වලින් 400 කට පමණ ආසන්න පිරිසක් මේ වන විට ක්‍රීඩාවේ යෙදී ඇති අතර, ජාතික යොවුන් සේනාංකය විසින් අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වෙමින් පවතින බව පෙන්වා දෙමි. | සම්පත් උපරිම අයුරින් භාවිතා කළ යුතුය. |

## 3.6 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 හා 2017 වර්ෂවල ඉදිකිරීම් ආරම්භකර විවිධ හේතු මත අත්හැර දමා තිබූ පුහුණු මධ්‍යස්ථාන 13 ක් පැවතුණි. ඒ වෙනුවෙන් රු. මිලියන 852.63 ක මූලික ඇස්තමේන්තුවක් අනුමත කරගෙන තිබූ අතර ප්‍රවර්ථන වර්ෂය අවසන් වන විට රු.මිලියන 438.12 ක වියදමක් දරා තිබුණි. මෙම ව්‍යාපෘති වර්ෂ 07 කට වැඩි කාලයක සිට සම්පූර්ණ නොකර පැවතීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලඟාකර ගැනීමට නොහැකිවී තිබුණි. | මෙම ඉදිකිරීම් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය (NEMO) හා පුද්ගලික අංශයේ කොන්ත්‍රාත්කරුවන් විසින් සිදු කරනු ලැබීය. NEMO ආයතනය වසා දැමීමෙන් පසු එම ඉදිකිරීම් කිහිපයක් පුද්ගලික අංශයේ කොන්ත්‍රාත්කරුවන් ලවා සිදු කරන ලදි. ඉතිරි මධ්‍යස්ථානයන්හි ඉදිකිරීම් කටයුතු, 2025, 2026 හා 2027 වර්ෂයන්හි දි සිදුකිරිම සඳහා සැලසුම් කර ඇත. | ඉදිකිරීම් ව්‍යාපෘති කඩිනමින් නිම කළ යුතුය. |